**දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 43/2013**

ඛ/12/02/අයවැය/2013
මුලා ශාඛාව,
බන්ධනාගාර මූලස්ථානය.
2013.12.9

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලිකනිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

## 2013වර්ෂය සඳහා ගිණුම්පියවීම.

2013 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 2013.11.04 දිනැති 231/2013 චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013.11.18 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 04/2013 සම්බන්ධවයි. අදාල චක්‍රලේඛ www.treasury.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබා ගත හැක. එම චක්‍රලේඛ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

01. 2013 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා ගැනීම.

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2013 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වැය විෂයන් කිහිපයකම මේ වන විට අවසන්ව ඇතිබැවින්, ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සියලුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. 2013 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාවඉක්මවා (ඒ ඒ 'වැය විෂයන්වලට අදාලව)කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන 'වග බලා ගත යුතුය. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන හා අක්මුදල් ඉතිරි වන්නේ නම් ඒ බව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත විද්‍යුත් තැපැල (commfinace@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් ගෙවීමට දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියලුම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා වියදම් නොදැරීමටත් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් කිරීමටත් කටයුතු කල යුතුය.

iv. 2013 වර්ෂයට අදාල සියළුම ගෙවීම් වවුචර අදාල සැපයුම්කරුවන් ගෙන් වර්ෂය අවසන 'වීමට පෙර ගෙන්වා ගැනීමට අදාල නිලධාරීන් කටයුතු කල යුතුය. එම වවුචර ගිණුම් අංශය වෙත නොපමාව ලබා දීමට අදාල අංශ ප්‍රධානීන් කටයුතු කල යුතුය. මේ පිළිබඳව අදාල සැපයුම්කරුවන්ට ලිඛිතව දැනුම් දීමට පියවර ගත යුතුය.

02. <u>2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතපියවීම.</u>

i. සියළුම බන්ධනාගාර ආයතනවල 2013 දෙසැම්බර් 31 දිනට පෙර ගමන් වියදම්, ඉන්ධන අත්තිකාරම්, සුළු අක්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසන් සති දෙක තුල අත්‍යාවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදිය යුතුය.

ii. <u>2013.12.31 දිනට මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ බොරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක 7041491 ට චෙක්පතක් ලියා මුදල් පොත ශුන්‍ය කළ යුතුය. එම චෙක් පතේ ඡායා පිටපතක් විද්‍යුත් තැපැල (commfinace@prisons.gov.lk) හෝ ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම ප.ව. 2.00 ට පෙර එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැතිනම් ඒ පිළිබඳව ද ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය.</u>

iii. බන්ධනාගාර ආයතනවල ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය ඇමුණුම 01 හි දක්වා ඇත. අදාල නිලධාරීන් ඒ ඒ ආයතනවල මුදල් පොතවැසීමේ වගකීම දැරිය යුතුය. 2013.12.31 දිනෙන් පසුව කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකි වන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තින්තෙන් ඉරක් ඇද තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2013 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

iv. 2014 වර්ෂය සඳහා අවශ්‍ය අත් මුදල් බන්ධනාගාර මූලස්ථානය මගින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතුය.

03. <u>මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

i. **2013 දෙසැම්බර් මස මාසික ගිණුම් සාරාංශය 2014.01.06 වන දිනට පෙර ලබා දිය යුතුය.** පලමු වන ගිණුම් සාරාංශයේ යම්කිසි ගිණුම්කරණ දෝෂයක් නිවරදි කිරීම හෝ හරස් සටහන් මගින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පර්පූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. **පර්පූරක ගිණුම් සාරාංශය 2014.01.13වන දිනට පෙර ලබා දිය යුතුය.**

ii. ගිණුම් කටයුතු පියවීම සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් වේනොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි. බන්ධනාගාර කර්මාන්ත අංශයේ ගිණුම් හා මුදල් පොතපියවීම සම්බන්ධව වෙනමම චක්‍රලේඛයක් නිකුත්කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

චන්ද්‍රරත්නපල්ලේගම
බන්ධනාගාර කොමසාරිස්ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත :-

01. විගණකාධිපති
02. කොමසාරිස් මුදල් - අභ්‍යන්තර විගණන

## 2013වර්ෂයේ ගිණුම්පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| අංකය | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|
| 01 | එච්.සී.ඩබ්. කාර්යවසම් | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | බන්ධනාගාර මූලස්ථානය |
| 02 | J.A.G. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | වැලිකඩ |
| 03 | K.K.S.U. රංජන් | සහකාරබන්ධනාගාර අධිකාරී | කොළඹ රිමාන්ඩ් |
| 04 | E.M.J.C.B. ඒකනායක | සහකාරබන්ධනාගාර අධිකාරී | ප.වි.පු.ම. |
| 05 | L.H.E. රංජන් | බන්ධනාගාර අධිකාරී | මැගසින් |
| 06 | T.W.L. චන්ද්‍රසිරි | සහකාරබන්ධනාගාර අධිකාරී | මහර |
| 07 | K.A.S. කොඩිතුවක්කු | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මීගමුව |
| 08 | H.A.M.S.B. සේනානායක | සහකාරබන්ධනාගාර අධිකාරී | දූම්පොත |
| 09 | J.A.T. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | මහනුවර |
| 10 | G.M.P. ලියනගේ | සහකාරබන්ධනාගාර අධිකාරී | පල්ලේකැලේ |
| 11 | H.A.C. පෙරේරා | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | යාපනය |
| 12 | T.I. උඩුවර | සහකාරබන්ධනාගාර අධිකාරී | අනුරාධපුරය |
| 13 | D.M.S.G. දසනායක | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | බදුල්ල |
| 14 | V.M.P. රණවක | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | තල්දෙන |
| 15 | L.J.M.K. බණ්ඩාර | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මඩකලපුව |
| 16 | W.A.D.C. කරුණාසේකර | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | ගාල්ල |
| 17 | K.W.S. ධම්මික | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මාතර |
| 18 | එස්.කේ. පල්ලෙතැන්න | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | වීරවිල |
| 19 | U.B. වලිසුන්දර | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | තංගල්ල |
| 20 | R.S. අලහකෝන් | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | කෑගල්ල |
| 21 | H.M.W.N.N. බණ්ඩාර | සහකාරබන්ධනාගාර අධිකාරී | කළුතර |
| 22 | W.A.D.C. කරුණාසේකර | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | බූස්ස |
| 23 | S.R. ජයවීර ද සිල්වා | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කුරුවිට |
| 24 | K.A.A.L.P. ගුණවර්ධන | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වටරැක |
| 25 | A.H.M. අලහකෝන් | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වාරියපොළ |
| 26 | A.M.W. බණ්ඩාර | සහකාරබන්ධනාගාර අධිකාරී | පොළොන්නරුව |
| 27 | D.A.M.N. ශාන්ත | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මොණරාගල |
| 28 | J.C. වීරසිංහ | සහකාරබන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | ත්‍රිකුණාමලය |
| 29 | S.K.U.S. ප්‍රනාන්දු | බන්ධනාගාර අධිකාරී | අඟුණකොළපැලැස්ස |

- යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේනම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කළ යුතුය.